# වෙරිටේ විදසුන්

සැප්තැම්බර් 2022

10 වැනි වෙළුම
02 වැනි කාණ්ඩය


Verité Research
Strategic Analysis for Asia

වෙරිටේ රිසර්ච් යනු, ආර්ථික විද්‍යාව, නීතිය, දේශපාලනය සහ ජනමාධ්‍යය විෂයෙහි ඉහළ මට්ටමේ තීරකවරුන් සඳහා උපායමාර්ගික විශ්ලේෂණ සපයා දෙන, කොළඹ පිහිටි, ස්වාධීන බුද්ධි පර්ෂදයකි.


**හර්සා හනිෆා**
**අශ්වින් පෙරේරා**
*පර්යේෂක*

**නිශාන් ද මෙල්**
*විදසුන් මාලා සංස්කාරක*


රුපියල් බිලියන
**45**
මිල/බදු සූත්‍රය ක්‍රියාත්මක වේ නම් 2023 දී ලැබෙන අමතර ආදායම

රුපියල් බිලියන
**85**
මිල/බදු සූත්‍රය ක්‍රියාත්මක නොකිරීම නිසා 2020 සිට 2022 දක්වා අහිමි වූ සමුච්චිත ආදායම

සියයට
**50**
දැනට පවතින පොහොර සීමා කිරීම් යටතේ මීළඟ අස්වැන්නේ අඩුවීමක් අපේක්ෂා කරන ලදි


Image courtesy of Unsplash

# දුම්වැටි බදු අයකිරීමේ සූත්‍රය- අමතක වීමේ පිරිවැය

2019 දී රජය විසින් දුම්වැටිවල බදු සහ මිල නියම කිරීම, දර්ශකයකට අනුව සකසන ලද සූත්‍රයක් මත පදනම්ව සිදු කිරීමේ ප්‍රතිපත්තියක් හඳුන්වාදෙනු ලැබිණි. එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අමතක වීමේ පිරිවැය ඉහළ ය: 2020 සිට 2023 දක්වා කාලය තුළ රුපියල් බිලියන 85ක අහිමි වූ අත්හරින ලද ආදායම එහි ප්‍රතිඵලය වන අතර 2023 දී තවත් බිලියන 45ක් එනිසා අහිමි වනු ඇත.

ශ්‍රී ලංකාව වර්තමානයේදී එහි ඉතිහාසයේ මුහුණ දී ඇති දරුණුතම ආර්ථික අර්බුදයට මුහුණ දෙමින් සිටී. මෙහිදී ප්‍රධානතම ගැටලුව වන්නේ ශ්‍රී ලංකාවේ ණය දරාගත නොහැකි තත්ත්වයට පත්ව තිබීමයි. රජයේ අපේක්ෂිත ආදායම රජය පවත්වා ගෙන යාමටත් රජයේ ණය සඳහා පොලී ගෙවීමටත් ප්‍රමාණවත් නොවන බව ඉන් අදහස් කෙරේ. ආර්ථිකය යළි ප්‍රකෘති තත්ත්වයට පත් කිරීම සඳහා ගත යුතු පියවර අතුරින් තීරණාත්මක පියවරක් වන්නේ රජයේ ආදායම ප්‍රමාණවත් ලෙස ඉහළ නැංවීමයි.

## ආර්ථික අර්බුදයට ප්‍රතිචාරයක් ලෙස මිල/බදු සූත්‍රය

ආදායම ඉහළ නැංවීමේ අරමුණින් ඉන්ධන සහ විදුලිය සඳහා මිල සූත්‍රයක් පැනවීමට යෝජනාවක් ඉදිරිපත් වී ඇත. සූත්‍රයකින් අත්වන ප්‍රතිලාභය වන්නේ එමගින් ආර්ථික මූලධර්මවලට අනුකූලව කාලීන සහ තිරසාර පදනමක් මත මිල සැකසීමට හැකිවීමයි. කිසිවෙකුගේ අභිමතය පරිදි හිටිහැටියේ ගනු ලබන ක්‍රියාමාර්ග තුළින් මිල සැකසීම හේතුවෙන් පැන නගින ප්‍රමාදයන් සහ නොගැලපීම් මග හරවා ගැනීමට මින් ඉඩ සැලසේ.

කෙසේවෙතත්, පෙර අයවැයවලදී ඉදිරිපත් කරන ලද මිල සූත්‍රයක් වර්තමානයේ අමතක වී ඇත. දුම්වැටි මිල සහ බදු අයකිරීම මත පනවන ලද සූත්‍රය එලෙස අමතක වී ඇති සූත්‍රයයි.

## නව අයවැය මගින් 2019 නැවතුණු තැන් සිට දුම්වැටි බදු අයකිරීම් සිදු කරනු ඇති ද?

දුම්වැටි මිල නාමික දළ දේශීය නිෂ්පාදිතයට අනුකූලව ක්‍රමානුකූලව දර්ශකයකට සම්බන්ධ කිරීම මත පදනම් කරගත් සූත්‍රයක් හා සබැඳි ප්‍රතිපත්තියක් 2019 අයවැය කථාව තුළින් ප්‍රකාශයට

**ආර්ථික අර්බුදය හමුවේ ශ්‍රී ලංකාව සංශෝධිත අයවැයක් ප්‍රකාශයට පත් කිරීමට ආසන්නව සිටින අවධියක වහාම ක්‍රියාත්මක වන පරිදි දුම්වැටි බදු සූත්‍රය ක්‍රියාවට නැංවීම නුවණට හුරු ය.**

පත් කරන ලදි. එවකට සිටි මුදල් අමාත්‍යවරයාගේ වචනවලින් කියතොත්, “සිගරැට් මත වන නිෂ්පාදන බද්ද ඒ අනුව, රටේ වර්ධන අනුපාතය, උද්ධමනය සැලකිල්ලට ගෙන දර්ශක මත පදනම්ව දුම්වැටි සඳහා වන නිෂ්පාදන බදුවල අවම වාර්ෂික වැඩවීම තීරණය කරනු ලබනවා. මෙමගින් ආදායම් සංරක්ෂණයක් නිෂ්පාදනවල නිසි පාලනයක් තහවුරු කර ගත හැකි වෙනවා.”

2019 වර්ෂයේ අයවැයෙහි දක්වන ලද මිල/බදු සූත්‍රයට අනුකූලව බදු වෙනස්කරනු ලැබුවේ නම්; සහ මෙම බදු වෙනස්වීම් ක්‍රමාංකනය කර දුම්වැටිවල දිග මත පදනම්ව වෙළඳපොළේ ඇති සියලුම දුම්වැටි සන්නාමවලට තාර්කික අයුරින් පැනවුයේ නම්,  2020 දී රජයට අමතර රුපියල් බිලියන 20ක ආදායමක් දුම්වැටි බදුවලින් අය කර ගත හැකිව තිබූ බව වෙරිටේ රිසර්ච් විසින් මීට පෙර පළ කරන ලද විදසුනකදී පෙන්වා දෙන ලදි.


2021 සිට 2023 දක්වා කාලය තුළ ආදායම කෙරෙහි එල්ල වූ ප්‍රතිවිපාකයන්ට අදාළ ගණනය කිරීම් මෙම විදසුන මගින් දක්වනු ලැබේ. මිල/බදු සූත්‍රය ක්‍රියාත්මක කිරීමට අසමත් වීම නිසා 2020 සිට 2022 දක්වා වූ වසර තුනක කාලය තුළ ශ්‍රී ලංකාවට රුපියල් බිලියන 85ක් අහිමි වී ඇති බව එමගින් සොයාගෙන තිබේ. මෙම වැරැද්ද නිවැරදි කිරීම මගින් 2023 දී දුම්වැටි බදු හරහා ලැබෙන ආදායම රුපියල් බිලියන 45කින් ඉහළ නැංවීමට හැකි වනු ඇත.

වර්තමානයේදී, දැනුවත්භාවය සහ ක්‍රියාත්මක වීම අතර පරතරයක් පවතී. ආර්ථික අර්බුදයේ ගිලී සිටින ශ්‍රී ලංකාව සංශෝධිත අයවැයක් ප්‍රකාශයට පත් කිරීමට ආසන්නව සිටින අවධියක වහාම ක්‍රියාත්මක වන පරිදි දුම්වැටි බදු සූත්‍රය ක්‍රියාත්මක කර, එසේ කිරීමට අසමත් වීමෙන් අහිමි වන සැලකිය යුතු තරම් විශාල ආදායම අයකර ගැනීම ආරම්භ කිරීම නුවණට හුරු ය.

## දැනුම සහ ක්‍රියාව අතර පරතරය

දුම්වැටි මත නිසියාකාරව බදු පැනවීමට අසමත් වීම, ආදායම මත සැලකිය යුතු බලපෑමක් එල්ල කරන බව වෙරිටේ රිසර්ච් ආයතනය විසින් මීට පෙර පළ කරන ලද විදසුන් කිහිපයක් මගින් ද ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය (Institute of Policy Studies – IPS) සහ දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය (National

**ප්‍රදර්ශිතය 1 - මිනුම් ලකුණ ලෙස ගෙන ඇත මිලට එදිරිව JPGL දුම්වැටිවල සැබෑ මිල**




Authority on Tobacco and Alcohol - NATA) විසින් සිදු කරන ලද ඒ හා සමාන පර්යේෂණාත්මක මැදිහත්වීම් මගින් ද යළි යළිත් හුවා දක්වා ඇත.

දුම්වැටි බදු සූත්‍රය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ක්‍රමවේදාත්මක මාර්ගෝපදේශය ප්‍රකාශයට පත් කර ඇති අතර රජයට ඊට ප්‍රවේශ විය හැක. කෙසේ වෙතත්, අයවැයෙන් ප්‍රකාශයට පත් කරන ලද මෙම ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමට ශ්‍රී ලංකාව මෙතෙක් සමත් වී නැත. (බලන්න: අ ටෙක්නිකල් කේස් ෆො අෆෝඩබිලිටි බේස්ඩ් ප්‍රයිසිං ඔෆ් සිගරට්ස්/මිල දැරීමේ හැකියාව පදනම් කර ගනිමින් මිල නියම කිරීම වෙනුවෙන් විධිමාත්‍රික තර්කනයක් [A Technical Case for Affordability Based Pricing of Cigarettes], සැප්තැම්බර් 2014, වෙරිටේ රිසර්ච් ආයතනය විසින් පළ කරන ලද නොනිමි පත්‍රිකාව (working paper))

මිල/බදු සූත්‍රය ක්‍රියාත්මක කිරීම තුළින් රජයට 2023 දී තම ආදායම බිලියන 45කින් වැඩි කරගත හැකි බව ගණනය කිරීම් මගින් හෙළි විය.  වෙනත් ආකාරකයකට එම අතිරේක ආදායමේ බලපෑම විස්තර කරන්නේ නම්, එම අමතර ආදායම මගින් ශ්‍රී ලංකාවේ ආදායම් දිළිඳුකම සහ අවදානම අතින් පහළම මට්ටමේ සිටින දශමක තුන (එනම් වඩාත්ම දිළිඳු ගෘහ ඒකක 30%) සඳහා සමෘද්ධි ගෙවීම් ලෙස සිදු කරන උපකාර දෙගුණ කිරීමට හැකි වනු ඇත.

ආදායම් ප්‍රතිලාභවලට අමතරව, දුම්වැටි බදු සූත්‍රය නිසි පරිදි ක්‍රියාත්මක කිරීමෙන් දුම්වැටි පරිභෝජනයෙන් සිදුවන සෞඛ්‍ය ආශ්‍රිත හානිය අවම වීම සහ එමගින් සෞඛ්‍ය සේවා පිරිවැය පහත දැමීමට හැකි වීම වැනි සමාජ ප්‍රතිලාභයන් ද අත් කර ගත හැකි වනු ඇත.

## දුම්වැටි බදු සූත්‍රය යොදවන්නේ කෙසේ ද?

ශ්‍රී ලංකාව තුළ දුම්වැටි සඳහා මිල සහ බදු නියම කිරීම සඳහා වන ක්‍රමවේදාත්මක සහ විධිමාත්‍රික මාර්ගෝපදේශය වෙරිටේ රිසර්ච් ආයතනය විසින් පළ කරන ලද නොනිමි පත්‍රිකාව (ඉහත දක්වා ඇති) මත පදනම් වී ඇති අතර එමගින් වැදගත් විශ්ලේෂණාත්මක ගැටළු තුනක් විසඳනු ලැබේ: (1) වැඩිම පරිභෝජනයක් ඇති දුම්වැටි වර්ගය සඳහා මිනුම් ලකුණ වන මිල (benchmark price) සොයා ගැනීම. (2) දුම්වැටිවල මිල සඳහා ගෙන ඇති මිනුම් ලකුණ යාවත්කාලීන කිරීමේදී සැලකිල්ලට යුතු නිර්ණායක සඳහන් කිරීම (3) විවිධ වර්ගයේ දුම්වැටි අතර පවතින මිල වෙනස්කම් සඳහා තර්කානුකූල ක්‍රමවේදයක් යොදා ගැනීම.

නොනිමි පත්‍රිකාවට අනුව ක්‍රමවේදය යෙදවීමෙන්, සහ ගෝලීය දුම්කොළ පාලනය පිළිබඳ නීතිමය රාමුව සමඟ (Framework Convention on Tobacco Control) ශ්‍රී ලංකාව අනුකූල වීම පිළිබඳව වෙරිටේ රිසර්ච් ආයතනය සහ දුම්කොළ සහ මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය විසින් සම්පාදිත ප්‍රකාශනයෙහි ඇතුළත් වැඩිදුර මගපෙන්වීම් සැලකිල්ලට ගත් විට පෙනී යන්නේ JPGL දුම්වැටිවල වර්තමාන මිල, මිනුම් ලකුණ වන මිලට වඩා රුපියල් 29 න් අඩු බවයි (රූපය 1). දුම්වැටියක මිලෙන් 75% ක් බදු වශයෙන් අයකර ගැනීම දුම්වැටි සඳහා මිනුම් ලකුණ ලෙස ගෙන ඇති නිර්ණායකය වන අතර, එය පදනම් කරගනිමින් එක් එක් සන්නාමයේ දුම්වැටියක් සඳහා සැලසුම් කර ඇති බදු අයකිරීම 1 වගුවෙන් දක්වා ඇත. (බලන්න: FCTC Evaluation Sri Lanka’s compliance with Article 6, 2016, Verité Research & NATA)

JPGL දුම්වැටිවල මිල සඳහා මිනුම් ලකුණ තක්සේරු කිරීම මෙම ක්‍රමවේදය මගින් අවශ්‍ය කෙරේ. මෙම දුම්වැටි සන්නාමයේ මිල දරා ගැනීමට ඇති හැකියාව 1981 සිට 2000 අතර කාලය තුළ පැවති මට්ටමෙහි පවත්වා ගැනීමට හැකි වන සේ මෙම මිණුම් ලකුණ ගණනය කිරීම සිදු කරනු ලැබේ. දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය යොදා JPGL දුම්වැටිවල මිල වර්ධනය කිරීමෙන් එහි මිල දරා ගැනීමට ඇති හැකියාව නොවෙනස්ව පවත්වා ගෙන යනු ලැබේ. මෙම අගය 2022 දී 25% ක් සහ 2023 දී 20% ක් වන බවට මධ්‍යස්ථ මට්ටමේ තක්සේරුවක් ලබා දී ඇත. 2022 හි පළමු සිව් මාසයේ පමණක් උද්ධමනයේ සංයුක්ත වාර්ෂික වර්ධන වේගය 49.5% ක්

ප්‍රදර්ශිතය 2 - 2022 සහ 2023 සඳහා සූත්‍රය මත පදනම් වූ මිල සහ බදු

| සන්නාමය | දර්ශකය මත පදනම් මිල 2022 (රු. වලින්) | අදාළ බදු 2022 (එක් වැටියකට) | දර්ශකය මත පදනම් මිල 2023 (රු. වලින්) | අදාළ බදු 2023 (එක් වැටියකට) |
|---|---|---|---|---|
| ජේපීජීඑල් | 99.39 | 74.54 | 119.27 | 89.45 |
| කැප්ස්ටන් | 70.99 | 53.24 | 85.19 | 63.89 |
| නේවිකට් | 85.19 | 63.89 | 102.23 | 76.67 |
| බ්‍රිස්ටිල | 85.19 | 63.89 | 102.23 | 76.67 |
| බෙන්සන් ඇන්ඩ් හෙ(ඩ්)ජස් | 99.39 | 74.54 | 119.27 | 89.45 |
| ඩන්හිල | 99.39 | 74.54 | 119.27 | 89.45 |

* 2022 සහ 2023 වර්ෂ සඳහා වත්මන් උද්ධමන අනුපාත සහ අනුමාන කිරීම් මත පදනම්ව නාමික දළ දේශීය නිෂ්පාදිතයේ වැඩි වීම පිළිවෙලින් සියයට 25, 20 ලෙස තක්සේරු කර ඇත.

වන බැවින් ද එම කාල වකවානුව සඳහා ආහාර උද්ධමනයේ සංයුක්ත වාර්ෂික වර්ධන වේගය 60% ක් වන බැවින් ද, මෙය මධ්‍යස්ථ මට්ටමේ තක්සේරුවක් වේ.

මිනුම් ලකුණ ලෙස ගෙන ඇති මිල, අනෙකුත් සන්නාමවල දුම්වැටිවල දිග අනුව වෙනස් කිරීම තුළින් (දුම්වැටි අතර ආදේශ කිරීම වැළැක්වීම සඳහා) අනෙකුත් දුම්වැටි සන්නාම සඳහා මිල ගණන් ගණනය කරනු ලැබේ.

මෙලෙස තක්සේරු කරන ලද මිල ගණන් මත මිලෙන් 75% ක් වන බද්ද යෙදීම මගින් ඉලක්කගත බදු මුදල ගණනය කළ හැක. වත්මන්/පනවන ලද බදු සහ ආදායමත් සූත්‍රය ක්‍රියාත්මක කළේ නම් ලබා ගත හැකි වෙතැයි තක්සේරු කර ඇති බදු ආදායමත් අතර වෙනස ගණනය කිරීම මගින් අහිමි වන බදු ආදායම හඳුනා ගනු ලැබේ. අඩු ප්‍රමාණයන් වැඩි මිලකට අලෙවි වීම හේතුවෙන්, 2019 වසරේදී අලෙවි කරන ලද ප්‍රමාණයට සාපේක්ෂව සංශෝධිත මිල ගණන් යටතේ අලෙවි කළ හැකි ප්‍රමාණයන් තක්සේරු කිරීමේදී, දුම්වැටි ඉල්ලුම ගණනය කිරීම සඳහා වන ජාත්‍යන්තර සම්මතය මත පදනම්ව 0.5 ක මිල ඉල්ලුම් නම්‍යතාවක් යෙදීමෙන් ගණනය කිරීම සිදු කරනු ලැබේ.

## 2020 සිට දුම්වැටි බදු සූත්‍රය අමතක වීම

දුම්වැටි බදු සූත්‍රය 2019 අයවැය තුළින් ප්‍රකාශයට පත් කළ ද එය ක්‍රියාත්මක කිරීමට අමතක වී ඇති බව "සිගරට් ටැක්ස් ඉන්ඩෙක්සේෂන්, ගෙටිං ඉට් රයිට් ඇන්ඩ් ගෙටිං ඉට් රෝං/දර්ශකයක් මත පදනම්ව දුම්වැටි බදු අය කිරීම නිවැරදි ලෙස කිරීම සහ වැරදි ලෙස කිරීම/ Cigarette Tax Indexation, Getting It Right and Getting it Wrong" (වෙරිටේ රිසර්ච් ආයතනය, අගෝස්තු 2019) යනුවෙන් මීට පෙර පළ කරන ලද විදසුනකින් පෙන්වා දෙන ලදි. මෙම අමතක වීම දිගින් දිගටම සිදු වී, ඉන් අනතුරුව එළැඹි වසරවලදී රටාවක් බවට පත් වී ඇත. 2019 නොවැම්බර් සිට (ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරණයක් පැවති විට) මේ දක්වා කාලය තුළ අවස්ථා තුනකදී බදු සූත්‍රය අමතක කරමින් දුම්වැටි බදු අයකිරීම සහ මිල ගණන් සංශෝධනය කිරීම සිදු කර ඇත. මෙම අවස්ථාවලදී ක්‍රියාත්මක වූ බදු ප්‍රතිපත්තිය හිටිහැටියේ සම්පාදනය කරන ලද්දක් වූ අතර එමගින් ආදායම ඉහළ නැංවීම කෙරෙහි අහිතකර බලපෑමක් එල්ල විය.

1 වන අවස්ථාව (2019 දෙසැම්බර්): දුම්වැටියක් සඳහා නිෂ්පාදන බද්ද රුපියල් 11.67 සහ රුපියල් 42 අතර විය. එක් දුම්වැටියක් සඳහා වූ බද්ද විවිධ දුම්වැටි සඳහා රුපියල් 13.36 සහ රුපියල් 48.35 අතර අගයකින් ඉහළ නංවන ලදි. කෙසේ වෙතත්, දුම්වැටි සඳහා එකතු කළ අගය මත බද්ද සහ ජාතිය ගොඩ නැගීමේ බද්ද ඉවත් කර තිබූ අතර මේ අවස්ථාවේදී සිදු වූයේ බදු ඉහළ නැංවීම මීට හිලව් වීම පමණකි. දුම්වැටිවල මිලට හෝ මිල මත යොදන ලද බද්දට හෝ ඉන් බලපෑමක් නොවිණි.

2 වන අවස්ථාව (2021 දෙසැම්බර්): 2021 නොවැම්බර් දක්වා බදු අය කිරීමේ කිසිදු වෙනසක් නොමැතිව, ශ්‍රී ලංකාවේ වැඩිම පරිභෝජනයක් ඇති දුම්වැටි සන්නාමය වන JPGL හි මිල 2020 දී රුපියල් 65 සිට 2021 දී රුපියල් 70 දක්වා ඉහළ නැංවිණ. 2022 මැයි මාසය වන විට ද එහි මිල නොවෙනස්ව පැවතිණි. අනෙකුත් සන්නාම සඳහා බදු පැනවීම ද ඒ හා සමානව දෝෂ සහිත විය.

3 වන අවස්ථාව (2021 නොවැම්බර්): නීතියෙන් රජයට බලය ලබා දී ඇත්තේ මිල නියම කිරීමට නොව, බදු නියම කිරීමට පමණක් වුව ද, දුම්වැටියක මිල රුපියල් 5කින් ඉහළ දමන බව 2021 අයවැය කථාවේදී ප්‍රකාශ කරන ලදි. කෙසේ වෙතත්, දුම්වැටිවල මිලෙහි ප්‍රතිශතයක් ලෙස ගත් විට සමස්ත බදු අනුපාතය මෙම අවස්ථාවේදී පහත වැටිණි. දෙවනුවට ඉහළම වෙළඳපොළ කොටස හිමි වූ මිලිමීටර් 60 ට අඩු දුම්වැටි සඳහා එක් දුම්වැටියක් මත බද්ද රුපියල් 13.36 සිට රුපියල් 6.75 දක්වා අඩු කරන ලද අතර එය 50% ක පමණ අඩු වීමකි.

***

ණය තිරසර බව සහතික කිරීම සඳහා රජය විසින් තම ආදායම ඉහළ නංවා ගත යුතු වන සහ උද්ධමනයේ සංයුක්ත වාර්ෂික වර්ධන වේගය 50%ක් පමණ තිබියදීත් එකතු කළ අගය මත බද්ද ඉහළ නංවමින් සිටින අවධියක රාජ්‍ය ආදායම වැඩිකර ගැනීම සඳහාත්, අත්‍යවශ්‍ය පරිභෝජනයේ වෙනත් ආකාර මත ඇති බදු බර අඩුකර ගැනීම සඳහාත්, දුම්වැටි මිල සහ බදු සූත්‍රය යෙදවීමේ ඇති අවශ්‍යතාව ප්‍රබලව ඉස්මතු වේ.

දුම්කොළ මිල/බදු සූත්‍රය ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වීමෙන් රජය සැලකිය යුතු ආදායම් ප්‍රවාහයක් අත්හැර දමා ඇති බවත් තව දුරටත් අත්හරිමින් සිටින බවත් අදහස් කෙරේ. 2020 සිට 2022 අවසානය දක්වා කාලය තුළ එලෙස අත්හැරුණු සම්මුච්චිත ආදායම බිලියන 85 කි. දුම්කොළ මිල/බදු සූත්‍රය නිසි පරිදි ක්‍රියාත්මක වේ නම් 2023 දී එමගින් රුපියල් බිලියන 45ක අමතර ආදායමක් උපයා ගත හැකි වන බව අපේක්ෂිත කරුණකි. ජීවන වියදම ඉහළ යන සහ දැඩි ආර්ථික දුෂ්කරතා ඇති අවධියක දුම්වැටි බදු හරහා ආදායම් ප්‍රවාහය ප්‍රශස්ත මට්ටමකට ගෙන ඒමට අපොහොසත් වීම රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේ සැලකිය යුතු අසාමර්ථ්‍යයක් වනු ඇත.◆

Copyright © 2022 Verité Research Pvt Ltd. All Rights Reserved. ISSN: 2386-1762.